# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION


සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 308 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 20/02/2024 පැය 1440

## මාධ්‍ය නිවේදනය

**01.** **මනුෂ්‍ය ඝාතනයක් - ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසම.**

2024.02.20 වන අද දින උදෑසන කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඉඟුරුකඩේ හන්දිය ප්‍රදේශයේදි පුද්ගලයෙකු වැටි මියගොස් ඇති බවට ග්‍රෑන්ඩ්පාස් පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වූ සිරිමුතු උයන මහල් නිවාසය, ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මේ සම්බන්ධයෙන් සිදු කළ වැඩිදුර විමර්ශයේදී මෙම මිය ගිය පුද්ගලයාට තවත් පුද්ගලයෙකු විසින් හිස ප්‍රදේශයට කතුරකින් ඇණ ඝාතනය කර ඇති බවට නිරීක්ෂණය වී ඇති අතර මෘතශරිරය කොළඹ ජාතික රෝහලේ මෘතශරිරාගාරයේ තැන්පත් කර ඇත. ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02.** **බඹර ප්‍රහාරයක් - පස්සර පොලිස් වසම.**

2024.02.20 වන අද දින උදෑසන කාලයේ පස්සර පොලිස් වසමේ පස්සර ප්‍රදේශයේ පාසලක සරඹ සංදර්ශන පුහුණු වෙමින් සිටි සිසුන් පිරිසකට බඹර කූඩයක් ඇවිස්සීම හේතුවෙන් බඹර ප්‍රහරයකට ලක්ව සිසුන් 20 ක් පමණ තුවාල ලබා පස්සර දිසා රෝහලට ඇතුලත් කර ඇත.

ඉන් සිසුන් 10 දෙනෙකු නේවාසිකව ප්‍රථිකාර ලබන අතර අනෙක් සිසුන් ප්‍රතිකාර ලබා රෝහලෙන් පිටව ගොස් ඇත. පස්සර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**